# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2026.03.30<br>පැය 0545 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/534/2026 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.</u>**

***பொலிஸ் ஊடகப் பிரிவிற்கு அறியத்தரப்பட்ட முக்கிய தகவல்கள்***

### 01. මනුෂ්‍ය ඝාතනයක් - පිංවත්ත පොලිස් වසම.

2026.03.29 දින රාත්‍රී පිංවත්ත පොලිස් වසමේ ලෙස්ලි ගුණවර්ධන මාවත ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් තුවාල ලැබූ පුද්ගලයෙකු පානදුර රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට පිංවත්ත පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 37 ක් වූ පිංවත්ත, පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා අසල්වැසි නිවසක පුද්ගලයෙකු අතර ඇති වූ බහින් බස්වීමක් දුරදිග යාමෙන් එම පුද්ගලයා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදු කළ විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පානදුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු අත්අඩංගුවට ගැනිමට පිංවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### *கொலை சம்பவம் – பின்வத்த பொலிஸ் பிரிவு*

*2026.03.29 அன்று இரவு, பின்வத்த பொலிஸ் பிரிவின் லெஸ்லி குணவர்தன மாவத்தை பகுதியில் கூர்மையான ஆயுதத்தால் தாக்கப்பட்டு காயமடைந்த ஒருவர் பாணந்துறை வைத்தியசாலையில் அனுமதிக்கப்பட்ட பின்னர் உயிரிழந்ததாக கிடைத்த தகவலின் அடிப்படையில் விசாரணைகள் ஆரம்பிக்கப்பட்டுள்ளன.*

***உயிரிழந்தவர் 37 வயதுடைய பின்வத்த, பாணந்துறை பகுதியைச் சேர்ந்தவர்.***

*மரணமடைந்தவருக்கும் அயல் வீட்டில் வசிக்கும் ஒருவருக்கும் இடையே ஏற்பட்ட வாய்த்தகராறு தீவிரமடைந்ததில், அந்த நபர் கூர்மையான ஆயுதத்தால்*

தாக்கியதாக இதுவரை மேற்கொள்ளப்பட்ட விசாரணைகளில் தெரியவந்துள்ளது.

மரணம் அடைந்தவரின் உடல் பாணந்துறை வைத்தியசாலையின் மோர்ச்சரியில் வைக்கப்பட்டுள்ளது. சந்தேகநபரை கைது செய்ய பின்வத்த பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றனர்.

**02. හෙරොයින් සහ අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2026.03.29 දින උදෑසන ගණේමුල්ල පොලිස් වසමේ අන්තෝනි මාවතට හැරෙන හන්දිය අසල මාර්ග බාධක රාජකාරි යෙදී සිටි පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සැකකටයුතු යතුරුපැදියක් නවතා පරීක්ෂා කර ඇත.

එහිදී යතුරු පැදිකරු සහ පසුපැදිකරු සන්තකයේ තිබී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 470 ක් සහ හෙරොයින් ග්‍රෑම් 230 ක්** සොයා ගෙන ඇති අතර සැකකරුවන් දෙදෙනා යතුරුපැදිය ද සමඟ අත්අඩංගුවට ගෙන ගණේමුල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 25 සහ 26 වයස්වල පසුවන බොල්ලත, ගණේමුල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගණේමුල්ල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**ஹெரோயின் மற்றும் ஐஸ் போதைப்பொருளுடன் இருவர் கைது – விசேட அதிரடிப்படை கோனஹேன முகாம்**

2026.03.29 அன்று காலை, கணேமுல்ல பொலிஸ் பிரிவில் உள்ள அந்தோனி மாவத்தை சந்திப்பில் சோதனையில் ஈடுபட்டிருந்த விசேட அதிரடிப்படை கோனஹேன முகாம் அதிகாரிகள் குழு, சந்தேகத்திற்கிடமான மோட்டார் சைக்கிளை நிறுத்தி சோதனை செய்தனர்.

அதில், ஓட்டுநரும் பின்புறம் இருந்த நபரும் வைத்திருந்த 470 கிராம் ஐஸ் மற்றும் 230 கிராம் ஹெரோயின் கைப்பற்றப்பட்டதுடன் இருவரும் மோட்டார் சைக்கிளுடன் கைது செய்யப்பட்டு கணேமுல்ல பொலிஸாரிடம் ஒப்படைக்கப்பட்டனர்.

சந்தேகநபர்கள் 25 மற்றும் 26 வயதுடைய பொல்லத்த, கணேமுல்ல பகுதிகளைச் சேர்ந்தவர்கள்.

## 03. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තණමල්විල පොලිස් ස්ථානය

2026.03.29 දින දහවල් තණමල්විල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන් හා ඒකාබද්ධව ගල්වලපාය ප්‍රදේශයේ නිවසක වැටලීමක් සිදුකර **වියළි ගංජා කිලෝග්‍රෑම් 20 ක්, කේරළ ගංජා කිලෝග්‍රෑම් 01 ග්‍රෑම් 511 ක් සහ ගංජා ඇට කිලෝ 04 ග්‍රෑම් 140 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 34 ක් වන තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තණමල්විල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### *கஞ்சாவுடன் நபர் கைது – தணமல்வில பொலிஸ் நிலையம்*

*2026.03.29 அன்று மதியம், தணமல்வில பொலிஸ் மற்றும் விசேட அதிரடிப்படை தங்கல்லை முகாம் இணைந்து கல்வலபாய பகுதியில் உள்ள ஒரு வீட்டில் சோதனை மேற்கொண்டு:*

- *உலர்ந்த கஞ்சா – 20 கிலோ*
- *கேரள கஞ்சா – 1 கிலோ 511 கிராம்*
- *கஞ்சா விதைகள் – 4 கிலோ 140 கிராம்*

*இவற்றுடன் ஒருவரை கைது செய்தனர்.*

*சந்தேகநபர் 34 வயதுடைய தணமல்வில பகுதியைச் சேர்ந்தவர்.*

## 04. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය

2026.03.29 දින සවස අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත ගල්වරුසාව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **ගෝඩා ලීටර් 1116 ක් සහ නිති විරෝධී මත්පැන් ලීටර් 15 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 46 ක් වන කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### *சட்டவிரோத மது மற்றும் கோடாவுடன் நபர் கைது – அதுருகிரிய பொலிஸ் நிலையம்*

*2026.03.29 அன்று மாலை, அதுருகிரிய பொலிஸ் அதிகாரிகள் குழுவிற்கு கிடைத்த தகவலின் அடிப்படையில் கல்வருசாவ பகுதியில் சோதனை நடத்தி:*

- *கோடா – 1116 லிட்டர்*
- *சட்டவிரோத மதுபானம் – 15 லிட்டர்*

*இவற்றுடன் ஒருவரை கைது செய்தனர்.*

*சந்தேகநபர் 46 வயதுடைய கடுவெல பகுதியைச் சேர்ந்தவர்.*

**05. ත්‍රීරෝද රථයක් පෙරළී පුද්ගලයෙකු ජීවිතක්ෂයට - හතරලියද්ද පොලිස් වසම.**

2026.03.29 දින දහවල් හතරලියද්ද පොලිස් වසමේ හතරලියද්ද පොත්තපිටිය මාර්ගයේදී හතරලියද්ද දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියැදුරුට පාලනය කරගැනීමට නොහැකිව ප්‍රපාතයකට පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියැදුරු සහ පසුපස ගමන්ගත් පුද්ගලයින් දෙදෙනෙකු හතරලියද්ද රෝහලට ඇතුළත් කිරීමෙන් පසු එක් පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 48 ක් වූ හතරලියද්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හතරලියද්ද පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

***முச்சக்கர வண்டி கவிழ்ந்து ஒருவர் உயிரிழப்பு – ஹத்தரலியத்த பொலிஸ் பிரிவு***

*2026.03.29 அன்று மதியம், ஹத்தரலியத்த – பொத்தபிட்டிய வீதியில் ஹத்தரலியத்த நோக்கிச் சென்ற முச் சக்கர வாகனம் கட்டுப்பாட்டை இழந்து பள்ளத்தில் கவிழ்ந்ததில் விபத்து ஏற்பட்டுள்ளது.*

*இந்த விபத்தில் காயமடைந்த ஓட்டுநரும் மேலும் இருவரும் வைத்தியசாலையில் அனுமதிக்கப்பட்டனர். பின்னர் ஒருவரை உயிரிழந்ததாக அறிவிக்கப்பட்டது.*

*உயிரிழந்தவர் 48 வயதுடைய ஹத்தரலியத்த பகுதியைச் சேர்ந்தவர்.*

***பொலிஸ் ஊடகப் பிரிவு***